// Sri Lanka Gazette header
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2148/59 – 2019 නොවැම්බර් 09 වැනි සෙනසුරාදා – 2019.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/01/2015/46.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.06.29 වැනි දින අංක 2077/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඒ. ඩබ්. කේ. පෙරේරා මයා, අංක 143/3, හොරණ පාර, මහවිල, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2018.06.18 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2018.06.25 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11 - 1512/1

---

මගේ අංකය: IR/COM/01/2015/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඒ. ඩබ්. කේ. පෙරේරා මයා, නො. 143/3, හොරණ පාර, මහවිල, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, නො. 224/14 ඒ, කේ. ඒ. පියරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2015/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත
(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඒ. ඩබ්. කේ. පෙරේරා මයා, නො. 143/3, හොරණ පාර, මහවිල, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි ඒ. ඩබ්. කේ. පෙරේරා මහතාට 1974 අංක 04 දරන සේවක මණ්ඩල චක්‍රලේඛය පරිදි වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමේදී වන්දි මුදල් නොගෙවීමෙන් හා 2011.12.13 සිට 2012.05.02 දක්වා වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳ ව වේ''.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 1512/2

---

මගේ අංකය : IR/20/23/2013.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

## 4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2014.06.25 වැනි දින අංක 1868/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.06.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, නො. 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් 94 දෙනෙකු වෙනුවෙන්).

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

පැලා ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, සුපර් රෝඩ් 04, පළමු අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

අතර පවත්නා 2014.05.12 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. දනන්සූරිය මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2014.06.10 වන දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11 - 1513/1

මගේ අංකය: IR/ 20/23/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් 94 දෙනෙකු වෙනුවෙන්).

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

පැලා ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, සුපර් රෝඩ් 04, පළමු අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, යටිවාවල, අරලිය උයන, "මිගදය", නො. 339/01/ඩී/2, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/20/23/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් 94 දෙනෙකු වෙනුවෙන්).

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

පැලා ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, සුපර් රෝඩ් 04, පළමු අදියර, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''පැලා ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ මෙහි උපලේඛනයේ නම් සඳහන් සේවක සේවිකාවන් 94 දෙනෙකුගේ සේවය 2013.12.05 දින සිට අවසන් කිරීම යුක්ති සහගත ද? නැතහොත් එකී සේවක සේවිකාවන්ට කිනම් සහන ලබා දිය යුතු ද?" පිළිබඳ ව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

උපලේඛනය

01. කාරියවසම්ගේ ආරියවතී
02. ඩබ්. පී. එම්. ජයවික්‍රම
03. ඩී. එම්. කුලරත්න
04. ඩබ්. කේ. ජනක චන්දන
05. ඩී. ටී. කේ. දිසානායක
06. වෙදගෙදර පියසීලි
07. එස්. එල්. රෝසා
08. එන්. කේ. ඉන්ද්‍රාවතී
09. එන්. කේ. ආර්. එම්. ශ්‍රියාකාන්ති
10. ජී. එස්. එල්. පෙරේරා
11. ඒ. ඒ. ඩී. මල්ලිකා
12. පී. ප්‍රදීපා දිලානි
13. එල්. එල්. කුමුදුනී මංගලිකා
14. ඊ. ඒ. ඩී. ලාලනී එදිරිසිංහ
15. බී. ඒ. අතුල කුමාර
16. අයි. පී. චූලනී චම්පිකා
17. එච්. ජී. පී. කුමාරි
18. ආර්. එච්. එම්. චන්ද්‍රාවතී
19. එම්. එස්. එම්. ප්‍රනාන්දු
20. ජේ. ඒ. ජී. ප්‍රියංකා
21. කුමුදුනී ලක්මාලි
22. එම්. ඒ. චන්ද්‍රලතා
23. ඩී. ඩබ්. එම්. කේ. දස්කර
24. කේ. විජේකෝන්
25. පී. එම්. නිලන්ති හේමලතා
26. ඕ. එස්. ප්‍රියදර්ශනී
27. එස්. එම්. චාන්දනී
28. එන්. එල්. ඩී. කේ. ගුණවර්ධන
29. එච්. එම්. වී. රේණුකා දමයන්ති
30. එස්. එස්. දිසානායක
31. ටී. ඒ. සුමංගලී තිලකරත්න
32. වයි. ඒ. පී. වයි. බණ්ඩාර
33. එස්. ඩී. යූ. පී. සේසත්පුර
34. ඩී. එම්. සී. එස්. දිසානායක
35. ටී. ඉන්ද්‍රානි මල්කාන්ති
36. එච්. ඩී. තිසේරා
37. එල්. ජී. ප්‍රේමාවතී
38. පී. එල්. කාන්ති
39. එච්. කේ. පුෂ්පා දමයන්ති
40. ආර්. ඩබ්. එම්. ඩබ්. බී. විජේකෝන්
41. ආර්. එම්. සුමිත් කුලතුංග
42. කේ. එම්. එස්. එල්. ජයනාග
43. කේ. පී. ගැමුණු කුලසූරිය
44. පී. ඩී. ජයතිස්ස

45. ජී. එස්. එම්. දන්තනාරායන
46. එල්. සමන්ත
47. ඒ. එම්. සී. අතුකෝරාල
48. එන්. එස්. නවරත්න
49. පී. ඩී. එස්. එම්. වික්‍රමසිංහ
50. ඩී. ජී. සී. මාලනී
51. කේ. ආර්. ධනුෂ්ක
52. යක්දෙහිගේ අමිල අංජන සිල්වා
53. උඩහගෙදර චිත්‍රා චන්දන කුමාර
54. කේ. එම්. සුරංගිකා ශ්‍රීමාලි
55. ආර්. එම්. සුජිත් ප්‍රියන්ත
56. එන්. එරන්දතී
57. පී. චමින්ද සිල්වා
58. කේ. දිනූෂ චතුරංග සිරිවර්ධන
59. එන්. එස්. සිල්වා
60. සී. පී. එස්. මොහොට්ටි
61. එම්. ජී. ප්‍රියන්ත බණ්ඩාර
62. ආර්. ඩී. ප්‍රියන්ති
63. පී. ඩී. කේ. විමලසේන
64. යූ. ඩබ්. සී. කුමාරි
65. අයි. ජී. සරත් දසනායක
66. ඒ. ඒ. අරුණ නයනානන්ද
67. ඊ. නදීශා සඳරේණු
68. ඉලංගසිංහගේ තක්ෂිලා සංජීවනී ඉලංගසිංහ
69. එච්. කේ. හේමන්ත පුෂ්පකුමාර
70. ටී. ඩබ්. ඩී. දර්ශිකා සජීවනී
71. ටී. ජී. කේ. දිලාන්ති පියදස
72. ඒ. ජී. ගාමිණී විජේසිංහ
73. කේ. එච්. අයි. මධුවන්ති
74. බී. පුෂ්ප කුමාර
75. අයි. ආර්. මදුසංඛ
76. ඩබ්. එම්. පී. ඒ. මහේෂ් කුමාර
77. ටී. ඒ. මල්කාන්ති
78. යක්දෙහිගේ නෙල්කා ලක්මාලි
79. එම්. ජී. එම්. ජයන්ති
80. යූ. ජී. එස්. සූරියබණ්ඩාර
81. යූ. ඩී. ප්‍රියංකා උදයකුමාරි
82. එච්. එන්. එස්. දයාරත්න
83. ආශා දුෂ්ෂන්ති හලංගොඩ
84. කේ. පී. ඩිලාන් චතුරංග
85. බී. ඒ. එල්. ජයන්ති
86. එම්. ජී. ආර්. ආරියරත්න
87. ඉරේෂා සඳමාලි
88. එස්. ඩී. ඉශාන් මිලින්ද පෙරේරා
89. බී. කන්තනී
90. බී. කමදිනී
91. එම්. එම්. කොන්සි
92. විගනගේ නිමේෂා ගයානි පෙරේරා
93. ආර්. එම්. ඉෂාර විමලරත්න
94. එස්. තිවකරන්

මගේ අංකය: IR/ COM/01/2018/241.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මයා, නො. 80/7, වලලියද්ද, එල්ලක්කල.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එයාර්පෝර්ට් ඇන්ඩ් එවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තෙගොඩ, මද්‍රා උයන, නො. 149/102, කේ. කේ. කුමාරි ධනපාල මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/241.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මයා, නො. 80/7, වලලියද්ද, එල්ලක්කල.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එයාර්පෝර්ට් ඇන්ඩ් එවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් හි සේවය කළ ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මහතාට සහකාර ගණකාධිකාරී තනතුරට උසස් නොකිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද?" යන්න පිළිබඳ ව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 - 1514

---

මගේ අංකය: IR/ COM/03/2018/33.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. සී. එස්. වීරසූරිය මිය, අංක 448, එන් 6, ඇහැලගහහේන, පෙතියාගොඩ, ගම්පහ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තෙගොඩ, මදුා උයන, නො. 149/102, කේ. කේ. කුමාරි ධනපාල මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2018/33.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. සී. එස්. වීරසූරිය මිය, අංක 448, එන් 6, ඇහැලගහහේන, පෙතියාගොඩ, ගම්පහ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

එයාර්පෝර්ට් ඇන්ඩ් එවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"එයාර්පෝර්ට් ඇන්ඩ් එවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් හි සේවය කර ඇති පී. සී. එස්. වීරසූරිය මහත්මියට ශ්‍රේණිගත උසස්වීම් ලබා දීමේ දී අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුවී තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද?" යන්න පිළිබඳ ව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 - 1515

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.